# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

# 2016

## කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்

## DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

நிதி அமைச்சு,
செயலகம்
கொழும்பு 01.

Ministry of Finance
The Secretariat
Colombo 01.

*රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හි උපදෙස්වලට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.*

**කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව**

**මුදල් අමාත්‍යාංශය**

**මහලේකම් කාර්යාලය**

**කොළඹ 01.**

# පටුන

පිටුව


| | | |
|---|---|---|
| 01. | දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන් | 01 |
| 02. | 1.1 දැක්ම | 01 |
| | 1.2 මෙහෙවර | 01 |
| | 1.3 අරමුණු | 01 |
| | 1.4 කාර්යයන් | 02 |
| 02. | මූල්‍ය පරිපාලනය | 03 |
| 03. | භෞතික කාර්ය සාධනය | 04 |
| 3.1 | අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම | 04 |
| 3.2 | විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම | 05 |
| 3.3 | මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය | 05 |
| 3.4 | සංවර්ධන ව්‍යාපෘති වල කළමනාකරණ විගණනය ශක්තිමත් කිරීම | 06 |
| 3.5 | විශේෂ විමර්ශන හා විගණන කටයුතු | 07 |
| 3.6 | රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත මහා භාණ්ඩාගාර වාර්තා ඉදිරිපත් කිරීම | 10 |
| 04. | මානව සම්පත් සංවර්ධනය හා පොදු පරිපාලනය | 11 |
| 4.1 | දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය | 11 |
| 4.2 | 2016.12.31 දිනට කාර්ය මණ්ඩලය | 12 |
| 4.3 | 2016 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු | 14 |
| | 4.3.1 2016 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා | 14 |
| | 4.3.2 2016 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා | 16 |
| | 4.3.3 කාර්යාභිවර්ධන වැඩසටහන් | 17 |

## 01. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන්

### 1.1 දැක්ම

ඉහළම කාර්යසාධනයකින් හා වගවීමකින් යුත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතුකරන විශිෂ්ඨතම කළමනාකරණ විගණන කොටස්කරු බවට පත්වීම.

### 1.2 මෙහෙවර

කළමනාකරණ විගණනය තුලින් රාජ්‍ය සේවයේ වගවීම ඉහළ නැංවීම හා වටිනාකම් එකතු කිරීම සඳහා ස්වාධීන හා අරමුණු කරා ලඟාවීම සහතික කෙරෙන උපදේශාත්මක සේවා සැපයීම.

### 1.3 අරමුණු

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි ඵලදායීත්වය ඉහල නැංවීම සඳහා දායකවීම.
2. විගණන හා කළමනාකරණ කමිටු මගින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.
3. කළමනාකරණ විගණනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හඳුන්වා දීම.
4. මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය මගින් ඉහළ කළමනාකාරිත්වයට සහායවීම.
5. සංවර්ධන ව්‍යාපෘතීන්හී කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
6. විශේෂ විමර්ශන කටයුතු තුලින් රාජ්‍ය අංශයේ සිදුවන හා සිදුවිය හැකි අක්‍රමිකතා අනාවරණය කිරීම හා එවැනි තත්ත්වයන් හා සිදුවීම් වළක්වා ගැනීමට නිර්දේශයන් සහ නිවාරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

## 1.4 කාර්යයන්

2008.01.25 දිනැති අංක. 08/0200/306/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස 2008.02.01 දින ස්ථාපනය කර ඇත. ප්‍රධාන ගණන් දිමේ නිලධාරින් හා ගණන්දිමේ නිලධාරින්ට භාණ්ඩාගාරයෙන් ලැබෙන සහාය තවදුරටත් ශක්තිමත් කිරීම එහි අරමුණ වී ඇති අතර ඒ අනුව අමාත්‍යාංශ හා අමාත්‍යාංශ යටතේ ස්ථාපිත කර ඇති ස්වාධීන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශවලට මඟ පෙන්වීමත් එමඟින් එම කටයුතු ශක්තිමත් කිරීමත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ.

**කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්යයන් :**

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයේ ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.

2. මුදල් අමාත්‍යාංශය, භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ ඒ යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ විගණනයට භාජනය කිරීම.

3. අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම.

4. අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය හා අවශ්‍ය මගපෙන්වීම් කිරීම.

5. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ අභ්‍යන්තර විගණන කුසලතා දියුණු කිරීම.

6. මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම සහ අනෙක් අමාත්‍යාංශවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා මඟපෙන්වීම.

7. රාජ්‍ය අංශය අනුගමනය කරන අවදානම් ඇගයීමේ ක්‍රමවේදයේ ප්‍රමාණාත්මක බව ඇගයීම.

8. විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම.

9. රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් සඳහා සහභාගීවීම හා මහා භාණ්ඩාගාර වාර්තාව සකසා ඉදිරිපත් කිරීම.

## 02. මූල්‍ය පරිපාලනය

2016 අයවැය ඇස්තමේන්තුව මගින් වැය ශීර්ෂ 324 වැඩසටහන අංක 01 ව්‍යාපෘතිය අංක 01 යටතේ මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබිණි. 2017 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සැකසීමේදී 2016 වර්ෂයේ ප්‍රතිපාදන සංශෝධනය කෙරුණි. එම ප්‍රතිපාදන වැය කළ ආකාරය පහත දැක්වේ.

| වියදම් විස්තරය | සංශෝධිත ඇස්තමේන්තු වෙන්කිරීම (රු.) | අමතර ප්‍රතිපාදන වෙන්කිරීම (රු.) | මු.රෙ. 66 හා 69 අනුව මාරු කිරීම (රු.) | තත්‍ය වියදම (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම් (අ)** | **34,500,000** | **8,040,000** | **-** | **41,324,556** | **1,215,444** |
| පුද්ගල පඩිනඩි | 26,000,000 | 3,410,000 | 900,000 (900,000) | 28,671,839 | **738,161** |
| අනෙකුත් වියදම් | 8,500,000 | 4,630,000 | 577,000 (577,000) | 12,652,717 | **477,283** |
| **මූලධන වියදම් (ආ)** | **1,300,000** | **570,000** | | **1,681,166** | **188,834** |
| **2002** යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා | 200,000 | - | - | 92,007 | 107,993 |
| **2102** ලීබඩු හා කාර්යාලීයඋපකරණ | 100,000 | 150,000 | - | 234,432 | 15,568 |
| **2103** යන්ත්‍ර හා උපකරණ | 500,000 | 150,000 | | 630,320 | 19,680 |
| **2401** හැකියා වර්ධනය | 500,000 | 270,000 | - | 724,407 | 45,593 |
| **මුළු එකතුව (අ) + (ආ)** | **35,800,000** | **8,610,000** | **-** | **43,005,722** | **1,404,278** |

### රජයේ නිලධරයන්ගේ අත්තිකාරම් 'බී ' ගිණුම

2016 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අනුමත අත්තිකාරම් 'බී 'ගිණුමේ විස්තර පහත දැක්වේ.

| විස්තරය | අනුමත සීමාව (රු.) | තත්‍ය වියදම (රු.) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | **2,200,000** | **2,180,210** |
| අවම ලැබීම් සීමාව | **1,250,000** | **2,218,210** |
| උපරිම හර ශේෂ සීමාව | **10,000,000** | **6,014,647** |

# 03. භෞතික කාර්ය සාධනය

## 3.1. අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම

අභ්‍යන්තර විගණනයෙන් අපේක්ෂිත පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්තව සිටින අභ්‍යන්තර විගණකවරුන්, සංවර්ධන නිලධාරීන්, සහ එම අංශ වල රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන්ගේ වෘත්තීය දැනුම ඉහළ නැංවීමට හා විගණනය පිළිබඳව කාලීන තොරතුරු ලබාදීමට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නිරතුරුවම කටයුතු කරයි. එම අරමුණ ඇතිව 2016 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් වැඩමුළු පවත්වන ලදී.

| පැවැත්වූ දිනය | වැඩමුළුවේ මාතෘකාව | සහභාගි වූ අය |
|---|---|---|
| 2016-06-28 | අභිප්‍රේරණය හා කළමනාකාරිත්ව ප්‍රවර්ධනය | අමාත්‍යාංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දෙපාර්තමේන්තුවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් |
| 2016-03-09 | රජයේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කර ගැනීම පිළිබඳ වැඩමුළුව | ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් |
| 2016-12-15 | රාජ්‍ය අංශයේ භාවිතයට ගනු ලබන පරිගණකගත වැඩ සටහන් වන CIGAS හා GOVERNMENT PAYROLL SYSTEM විගණනය පිළිබඳ පුහුණු වැඩ මුළුව | අමාත්‍යාංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දෙපාර්තමේන්තුවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් |
| 2016-12-01, 09, 08.16.17 2016-11-10,15 | කළමනාකරණ විගණන චක්‍රලේඛ ක්‍රියාවට නැංවීම | ප්‍රධාන අභ්‍යන්තර විගණන අංශවල සියළුම නිලධාරීන් |

## 3.2. විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරිම

රජයේ අමාත්‍යාංශයන්හි විගණන හා කළමනාකරණ කමිටුවලට භාණ්ඩාගාර නියෝජිත ලෙස කමිටු සාමාජිකයෙකු වශයෙන් මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වේ.එම නිලධාරීන් විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම ඵලදායීව හා අඛණ්ඩව පැවැත්වීම පිළිබඳව මාර්ගෝපදේශ සැපයීම හා අධීක්ෂණය කිරීම් සිදුකර ඇත. එමෙන්ම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක ශක්තිමත් කිරිමටත්, අභ්‍යන්තර විගණන වාර්තා හා රජයේ විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති විශේෂ කරුණු සම්බන්ධව තීරණ ගැනීමටත් අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතුකර ඇත. තවද කමිටු තීරණ ක්‍රියාත්මක කිරිම පිළිබඳව පසු විපරම් කිරිමද මගින් රාජ්‍ය අංශයේ කළමනාකරණ කටයුතු ශක්තිමත් කිරිමට දායකත්වය සපයා ඇත.

චක්‍රලේඛ විධිවිධාන අනුව 2016 වසර තුල අමාත්‍යාංශ 50 ක පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 207 කටද , දෙපාර්තමේන්තු 06 ක පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 34 කටද, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව යන රාජ්‍ය ආයතන වල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 20 කටද මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වි ඇත. තවද මුදල් අමාත්‍යාංශයට අයත් ආයතනයක් වන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 කටද මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගිවී ඇත.

## 3.3. මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය

මුදල් අමාත්‍යාංශය හා භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවලට අදාළ කළමනාකරණ විගණනය සිදු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් සේ සැලකේ. 2016 වර්ෂයේදී ද මෙම කාර්යය සාර්ථකව සිදු කළ අතර, ඒ අනුව පහත දක්වා ඇති සෑම ආයතනයක් වෙනුවෙන්ම කාර්තුවකට එක් කළමනාකරණ විගණන වාර්තාවක් බැගින් කළමනාකරණ විගණන වාර්තා 04 ක් නිකුත් කර ඇත. එමඟින් එම ආයතනවල කාර්යක්ෂම හා ඵලදායි අභ්‍යන්තර පාලන විධි ක්‍රම පවත්වාගෙන යාමටත් ඒ තුළින් වඩාත් ඉහළ කාර්ය සාධනයක් ළඟාකර ගැනීමටත් පිටුවහලක් ලැබී ඇත.

ජාතික අයවැය දෙපාර්තමේන්තුව

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

නීති කටයුතු දෙපාර්තමේන්තුව

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව

කළමනාකරණ සේවා දෛපාර්තමේන්තුව

මුදල් අමාත්‍යාංශය සඳහා නිකුත් කර ඇති කළමනාකරණ විගණන වාර්තා ගණන 2ක්ද වේ.

## 3.4 සංවර්ධන ව්‍යාපෘති වල කළමනාකරණ විගණනය ශක්තිමත් කිරීම

සියළු අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති වල අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත් කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. ඒ අනුව ඩොලර් මිලියන 10 ට වඩා වැඩි සංවර්ධන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරු පත්කිරීම සඳහා වන කටයුතු නියමානුකූලනය කිරීම සඳහා උපදෙස් චක්‍රලේඛයක් මගින් නිකුත්කිරීම සඳහා වන කටයුතු ආරම්භ කරන ලදී. තව ද පහත දක්වා ඇති සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ විගණනයක් සිදුකර වාර්තා 4 ක් ද ඉදිරිපත් කර ඇත.

1. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය.

2. ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතිය

3. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ගබඩා කළමනාකරණ ව්‍යාපෘතිය

## 3.5 විශේෂ විමර්ශන හා විගණන කටයුතු

මුදල් අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වෙත මෙන්ම මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන පැමිණිලි මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ නියමය පරිදි පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා කළමනාකරන විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබයි. එසේ යොමු කරනු ලදුව ඉටුකරන ලද පරීක්ෂණයන්ගේ වාර්තාවක් භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ අදාල ආයතනයේ ප්‍රධානීන් හට යොමු කරනු ලබන අතර විමර්ශනය අනුව හෙලිදරව්වන අඩුපාඩු සහ අක්‍රමිකතා නැවත ඇතිවීම වළක්වා ගැනීම මෙහි අරමුණ වේ.

2016 වර්ෂයේදි කළමනාකරන විගණන දෙපාර්තමේන්තුව මගින් විමර්ශන කටයුතු අවසන්කර ඇති විමර්ශන සංඛ්‍යාව 18 ක් වන අතර වසර තුල ඉදිරිපත්වු පැමිණිලි 12ක් සඳහා තවදුරටත් විමර්ශන සිදුකෙරෙමින් පවතී. තවද 2016 වර්ෂය තුලදී ලැබී අවසන් කළයුතුව පවතින විමර්ශන ගණන 6 ක් වන අතර 2016 වර්ෂය තුල නිම කරන ලද විශේෂ විගණන ගණන 06කි.

### 2016 වර්ෂයතුලදී අවසන් කර ඇති විමර්ශන

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 01 | දේශිය ආදායම් දෙපාර්තමේන්තුව | රජයේ ආදායම් වලක්වාලමින් අයථා ලෙස මුදල් රැස්කරන නිලධාරීන් පිළිබඳ විමර්ශනය |
| 02 | දිවිනැගුම දෙපාර්තමේන්තුව | සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදලින් දහම් පාසල් නිල ඇදුම් බෙදා දිම පිළිබඳ විමර්ශනය |
| 03 | ක්‍රිඩා අමාත්‍යාංශය | ශ්‍රි ලංකා මල්ලව පොර සංගමයේ මුල්‍ය අක්‍රමිකතා පිළිබඳව වන විමර්ශනය |
| 04 | ලෝහෝර් ආර්යා ණය අරමුදල | ලෝහෝර් ආර්යා ණය අරමුදලේ වර්තමාන තත්ත්වය පිළිබඳ විමර්ශනය |
| 05 | සුරාබදු දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුවේ නව පරිපාලනයට එරෙහිව වන චෝදනා පිළිබඳව වන විමර්ශනය |
| 06 | සුරාබදු දෙපාර්තමේන්තුව | රා රේන්ද බලපත්‍ර ප්‍රදානයේ දී අයථා ක්‍රියා සිදු කිරිම හා මාසික රේන්ද වාර්තා නොකිරිම |

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 07 | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | දූෂණ -ක්‍රියා පිළිබඳ විමර්ශනය |
| 08 | පේරාදෙනිය රෝහල | මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීම සම්බන්ධ විමර්ශනය |
| 09 | සෞඛ්‍ය අමාත්‍යාංශය | රෝහල් පිරිසිදු කිරීමේ සේවාව පිළිබඳ විමර්ශනය |
| 10 | නැගෙනහිර පළාත - පුරනැගුම ව්‍යාපෘතිය, මඩකළපුව | දිස්ත්‍රික් ව්‍යාපෘති කළමනාකරු විසින් බලය අයථා ලෙස යෙදවීම සම්බන්ධ විමර්ශනය |
| 11 | ජිම්කානා සමාජය | මත්පැන් බලපත්‍ර අයථා භාවිතය පිළිබඳ විමර්ශනය |
| 12 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ විශාලතම අපකීර්තිය හා සොරකම පිළිබඳ විමර්ශනය |
| 13 | අංක 05 දේවාල පටුමඟ - කෝට්ටේ | අංක 05 දේවාල පටු මග - කෝට්ටේ අනවසර ඉදි කිරීමක් සම්බන්ධ විමර්ශනය |
| 14 | අවිස්සාවේල්ල මහජන බැංකුව | උකස් තබන ලද රත්‍රං වංචනික ලෙස අස්ථාන ගත කිරීම සම්බන්ධ විමර්ශනය |
| 15 | දුම්රිය දෙපාර්තමේන්තුව | රජයේ මුදල් අවභාවිතා කිරීම සම්බන්ධ විමර්ශනය |
| 16 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුවේ තැගි මුදල් නොගෙවීම පිළිබඳ විමර්ශනය |
| 17 | ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තුවේ වර්තමාන පරිපාලනය පිළිබඳ විමර්ශනය |
| 18 | අපදා කළමනාකරණ අමාත්‍යාංශය | රාජ්‍ය මුදල් එලදායීතාවයෙන් තොරව වියදම් කිරීම පිළිබඳ විමර්ශනය |

## 2016 වර්ෂය තුල ලැබී තවදුරටත් කරමින් පවතින නිම නොවූ විමර්ශන

| අනු අංකය | ආයතනය | කාරණය |
|---|---|---|
| 01 | ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව | ලංකා පුත්‍ර බැංකුවේ හම්බන්තොට ශාඛාවේ සිදු වී ඇති මුල්‍ය වංචා හා අක්‍රමිකතා පිළිබඳ විමර්ශනය |
| 02 | දේශිය ආදායම් දෙපාර්තමේන්තුව | දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ සිදුවන දූෂණ වංචාවන් පිළිබඳව විමර්ශනය |
| 03 | කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | සෞරමූර්ති තොණ්ඩමන් පදනමේ සිදුවී ඇති දූෂණ සම්බන්ධ විමර්ශනය |
| 04 | තැපැල් දෙපාර්තමේන්තුව - යාපනය | යාපනය තැපැල් කාර්යාලයේ අක්‍රමිකතාවයන් පිළිබඳ විමර්ශනය |
| 05 | දේශිය ආදායම් දෙපාර්තමේන්තුව | විමර්ශන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් සම්බන්ධව වන විමර්ශනය |
| 06 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | ලේඛකාධිකාරිගේ දූෂණ හා වංචා පිළිබඳ විමර්ශනය |
| 07 | පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරිමේ අමාත්‍යාංශය | වංචාකාර වැඩ පිළිබඳ විමර්ශනය |
| 08 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | බොරු චෝදනාමත වැඩ තහනම් කිරිම හා බේරුවලට මාරු කිරිම පිළිබඳ විමර්ශනය |
| 09 | කොළඹ වරාය ඉදිකිරිමේ ව්‍යාපෘතිය | ව්‍යාපෘතියට ගෙන එන ලද යන්ත්‍ර හා වාහන ව්‍යාජ ලෙස අලෙවි කිරීම හා සම්බන්ධ විමර්ශනය |
| 10 | තැපැල් දෙපාර්තමේන්තුව | දිවයිනේ සියළුම තැපැල් අංශවල දූෂණයන් පිළිබඳ විමර්ශනය |
| 11 | තැපැල් දෙපාර්තමේන්තුව | වංචනිකව සිදුවන රාජ්‍ය මුදල් කොල්ලකෑම සම්බන්ධ විමර්ශනය |
| 12 | ජාතික විද්‍යා සභාව | රාජ්‍ය මුදල් අයථා පරිහරණය පිළිබඳ විමර්ශනය |

මෙම විමර්ශන කටයුතු 2016 වර්ෂය තුලදී අවසන් කිරිමට නොහැකි වුවත් ඒවායින් වැඩි ප්‍රමාණයක් අවසන් අදියර දක්වා නිමකර ඇත.

**2016 වර්ෂය තුල ලද, කටයුතු කලයුතුව පවතින විමර්ශන**

1.රජයේ නිලධාරින්ගේ සහ සාධක සංගමයේ 2016 නිලවරණය සම්බන්ධව

2.සංවර්ධන ලොතරැයි මණ්ඩලයට නව සේවකයින් බඳවා ගැනිම

3.නුවරඑළියේ  පොලිස් අධිකාරි කාර්යාලයේ කටයුතු

4.ජාතික රක්ෂණ  භාර අරමුදලේ කටයුතු

5.නිල වාහන හිමි නිලධාරීන් සංචිත වාහන භාවිතා කිරීම.

6.වංචනිකව විශ්‍රාම වැටුප්  ලබා ගැනීම.

## 2016 වර්ෂය තුලදී කරන ලද විශේෂ විගණන කටයුතු


| අනු අංකය | විශේෂ විගණනය |
|---|---|
| 01 | රජයේ ආයතන සතු වාහන පිළිබඳ විගණනය |
| 02 | මුදල් අමාතයාංශයට අයත් නිල නිවාස පිළිබඳ විගණනය |
| 03 | වාහන වායු විමෝචන භාරකාර අරමුදල  පිළිබඳ විගණනය |
| 04 | 2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය පිළිබඳ විගණනය |
| 05 | මුදල් අමාත්‍යාංශයේ 2015 වර්ෂයේ භාණ්ඩ සමික්ෂණ ක්‍රියාවලිය සහ අපහරනය පිළිබඳ විගණනය |
| 06 | ක්‍රිඩා අමාත්‍යාංශය විසින් පෞද්ගලික සමාගමක මුදල් ආයෝජනය කිරිම  පිළිබඳ විගණනය |

## 3.6 රාජ්‍ය ගිණුම් පිලිබඳ කාරක සභාව වෙත මහා භාණ්ඩාගාර වාර්තා ඉදිරිපත් කිරීම.

රජයේ ගිණුම් පිලිබඳ කාරක සභාව විසින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පලාත් පාලන ආයතන කැඳවීම් කරනු ලබන අවස්ථාවලදී ඒ ඒ ආයතන වලට අදාලව මහා භාණ්ඩාගාර වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබ ඇත. ඒ අනුව 2016 වර්ෂය තුල ඉදිරිපත් කරන ලද වාර්තා ගණන 77ක් වන අතර, එම කාරක සභා රැස්වීම් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ගේ සහභාගිත්වය ද දක්වා ඇත.

# 04. මානව සම්පත් කළමනාකරණය හා සාමාන්‍ය පරිපාලනය

## 4.1. 2016.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය




කා.සේ.සේ. – 4, රියදුරු -3, ** - විදේශ නිවාඩු , * - පුරප්පාඩු, , ප්‍ර.රා.ක.ස. - ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර, ස.නි. -සංවර්ධන නිලධාරී ,

ක.ස. - කළමනාකරණ සහකාර

## 4.2. කාර්ය මණ්ඩලය

### 2016.12.31 දිනට කාර්ය මණ්ඩලය

| තනතුර | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ප.සේ.) | 01 | 01 | - |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ග.සේ.) | 05 | 05 | - |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ක්‍ර.සේ.) | 02 | 02 | - |
| සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ග.සේ.) | 07 | 06 | 01 |
| පර්යේෂණ සහකාර / සංවර්ධන නිලධාරී | 09 | 06 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 14 | 12 | 02 |
| රියදුරු | 07 | 03 | 04 |
| කා.සේ.සේ. | 06 | 04 | 02 |
| එකතුව | **53** | **41** | **12** |

### 2016 වර්ෂයේ ස්ථාන මාරු ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරීන්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 01 | ජී.ජී. පබසරා මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2016.03.14 |
| 02 | ආර්.බී. ගන්කේවල මිය | අධ්‍යක්ෂ -ශ්‍රී.ලං.ප.සේ. | 2016.01.08 |
| 03 | ඩබ්. විමලසේන මයා | අධ්‍යක්ෂ- ශ්‍රී.ලං.ක්‍ර .සේ. | 2016.12.19 |
| 04 | ජී. මැද්දේගොඩගේ මහතා | සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 2016.01.04 |
| 05 | ඩබ්.එම්.ඩී. විජේබණ්ඩාර මයා | සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 2016.01.04 |
| 06 | කේ.පි.ජී.යූ. කාරියවසම් මෙය | සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 2016.01.05 |
| 07 | කේ.ඒ.එම්. කපුරුබණ්ඩාර මිය | සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 2016.01.12 |

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 08 | එම්.ජී.එන්.එස්. මීගස්මුල්ලමිය | සංවර්ධන නිලධාරි | 2016.01.02 |
| 09 | එස්.පී. එම්.ඩී. විජේවර්ධන මහතා | සංවර්ධන නිලධාරි | 2016.07.05 |
| 10 | ජී.ඒ.ටී.කේ. පෙරේරා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.04.08 |
| 11 | යූ.ඩී.එස්.කේ. අබේරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.09.06 |
| 12 | ඩබ්.කේ.ඩී.ඒ. වීරසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.09.06 |
| 13 | කේ. අතුකෝරල මයා | රියදුරු | 2016.07.11 |
| 14 | කේ.සි.යූ. ජයශාන්ත මයා | කා.සේ.සේ. | 2016.07.12 |

## 2016 වර්ෂයේ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරීන්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය |
|---|---|---|---|
| 01 | ජී. මැද්දේගොඩගේ මහතා | සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී.ලං.ග.සේ. | 2016.05.23 |
| 02 | කේ.ඒ.ඩී.ආර්.ටී. කහඳවආරච්චි මිය | සංවර්ධන නිලධාරි | 2016.02.01 |
| 03 | ඩබ්.ඩී.එස්.කේ. අලගියවන්න මිය | සංවර්ධන නිලධාරි | 2016.08.31 |
| 04 | ඩබ්.ජී.ටි. වානක මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.09.02 |
| 05 | ජී.ඩී.කේ. ලියනගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.09.02 |
| 06 | එච්.කේ.සී. ප්‍රියදර්ශනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.09.02 |
| 07 | ඩී.එස්.පී. වික්‍රමරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2016.04.05 |
| 08 | එච්.ඩී.පී. සරත්කුමාර මයා | රියදුරු | 2016.04.25 |
| 09 | ඩබ්.ආර්.ජයන්ත මයා | රියදුරු | 2016.01.12 |
| 10 | එස්.එම්.ආර්.පී. ගුණසේකර මහතා | රියදුරු | 2016.06.30 |
| 11 | පී.ජී.ඩී. ප්‍රේමකුමාර මයා | රියදුරු | 2016.02.18 |
| 12 | කේ.ඩී.එන්. ප්‍රේමලාල් මයා | කා.සේ.සේ. | 2016.07.05 |

## 4.3. 2016 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු

### 4.3.1. 2016 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා

| නිලධාරියාගේ නම | තනතුර | පැවැත්වූ රට | පුහුණු පාඨමාලාව | කාලය |
|---|---|---|---|---|
| **එස්.ඒ.සී. කුලතිලක මිය** | අධ්‍යක්ෂ ජනරාල් | ඇමරිකා එක්සත් ජනපදය | Leadership Decision Making Optimizing Organizational Performance -Harvard Kennedy School | 21.02.2016 26.02.2016 |
| | | ඉන්දියාව | Workshop on Internal Audit Functions in the Public Sector - Delhi | 05.09.2016 06.09.2016 |
| **ආර්.ආර්.කේ. නුගපිටිය මයා** | අධ්‍යක්ෂ | මලයාසියාව | Managerial Competency Development Program | 17.04.2016 23.04.2016 (First Session) |
| **එස්.එම්. දයාරත්න මයා** | අධ්‍යක්ෂ | මලයාසියාව | Managerial Competency Development Program | 17.04.2016 23.04.2016 (First Session) |
| **එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය** | අධ්‍යක්ෂ | මලයාසියාව | Managerial Competency Development Program | 17.04.2016 23.04.2016 (First Session) |
| **ඒ.එන්. හපුගල මයා** | අධ්‍යක්ෂ | හොංකොං | Executive Training Programme on Macroeconomic Policies at the University of Hong Kong | 01.08.2016 05.08.2016 |
| **එස්.කේ. කුසලකුමාරන් මයා** | අධ්‍යක්ෂ | ඉන්දියාව | Workshop on Internal Audit Function in the Public Sector – Delhi | 05.09.2016 06.09.2016 |

| නිලධාරියාගේ නම | තනතුර | පැවැත්වූ රට | පුහුණු පාඨමාලාව | කාලය |
|---|---|---|---|---|
| **ආර්.බී. ගන්කේවල මිය** | අධ්‍යක්ෂ | මලයාසියාව | International Programme & Study Tour on Risk & Change Management | 23.10.2016 30.10.2016 |
| **ඩී.ජී.ජී.එස්. දයානාත් මයා** | අධ්‍යක්ෂ | මලයාසියාව | International Programme& Study Tour on Risk & Change Management | 23.10.2016 30.10.2016 |
| **ඩබ්.එම්.ඩී. විජේබණ්ඩාර මයා** | සහකාර අධ්‍යක්ෂ | චිනය | Seminar on Cloud Computing, Big Data Network Construction and Developing Strategies for Developing Countries in 2016 | 24 .05.2016 12.06. 2016 |
| **ජේ.එච්. ප්‍රනාන්දු මිය** | සහකාර අධ්‍යක්ෂ | තායිලන්තය | International Programme on Management (Audit) | 24.07.2016 31.07.2016 |
| **කේ.පි.ජී.යූ. කාරියවසම් මෙය** | සහකාර අධ්‍යක්ෂ | තායිලන්තය | International Programme on Management (Audit) | 24.07.2016 31.07.2016 |
| **බී.ටී.එන්. මාලි මිය** | සහකාර අධ්‍යක්ෂ | මලයාසියාව | International Programme& Study Tour on Risk & Change Management | 23.10.2016 30.10.2016 |
| **කේ.ජී.එම්. කපුරුබණ්ඩාර මිය** | සහකාර අධ්‍යක්ෂ | මලයාසියාව | International Programme& Study Tour on Risk & Change Management | 23.10.2016 30.10.2016 |

### 4.3.2. 2016 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා

| පුහුණු පාඨමාලාව / වැඩසටහන | පුහුණු කාලය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|---|
| Applied Econometric-Practical Approach Using E-views Software | 09.02.2016 - 18.07.2016<br>අඟහරුවාදා දින උදේවරුව | ඩී.ජී.ජී.එස්. දයානාත් මයා | අධ්‍යක්ෂ |
| Managerial Competency Development Program<br>(Second Session) | 2016.05.05 සිට 08 දක්වා | ආර්.ආර්.කේ. නුගපිටිය මයා<br>එස්.එම්. දයාරත්න මයා<br>එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ |
| Training Program on How to Minimize Audit Quires | 2016.02.25/<br>26 | කේ.ඒ.එම්. කපුරුබණ්ඩාර මිය | සහකාර අධ්‍යක්ෂ |
| Workshop on Internal Audit 2016 | 2016.11.09 | ඒ.එන්. හපුගල මයා<br>බී.ටී.එන්. මාලී මිය | අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ |
| Two day Workshop on Salary Conversions | 2016.05.12 සහ 13 | කේ.ආර්.ආර්. ප්‍රනාන්දු මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| කාර්යාල උපකරණ පාලනය | 2016.05.26 සහ 27 | ඊ.එම්.ජී.එල්.ඒකනායක මිය<br>ජේ.පී. මුදලිගේ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |

| පුහුණු පාඨමාලාව / වැඩසටහන | පුහුණු කාලය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|---|
| විනය කාර්යය පරිපාටි පුහුණුව | 2016.08.24,25 සහ 26 | එම්.ඩී.එස්.එස්. විරසිංහ මිය<br>ජේ.පී. මුදලිගේ මයා | සංවර්ධන නිලධාරි<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |
| Workshop on Attitude and Skills Development (XIII) | 2016.06.24 | ඩබ්.ඩී.එස්.කේ. අලගියවන්න මිය<br>එම්.ඩී.එස්.එස්. විරසිංහ මිය | සංවර්ධන නිලධාරි<br>සංවර්ධන නිලධාරි |
| තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදනය සහ ඇගයීම පිළිබඳ වැඩමුළුව | 2016.08.30 සහ 31 | ජේ.ඒ. සන්ධ්‍යා මිය<br>පී.ඩබ්.බී.එම්. විමලචන්ද්‍ර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |
| National Diploma in English Language | සෙනසුරාදා දින<br>(මාස 4) | ඩබ්.ජී. මනෝජා වසන්ති මිය | සංවර්ධන නිලධාරි |

### **4.3.3** කාර්යාභිවර්ධන වැඩසටහන්

කළමනාකරන විගණන දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා " කාර්යාභිවර්ධනය " පිළිබඳ පුහුණු වැඩමුළුවක් 2016.03.11 දින කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලදී.